# ෆෙඩරල් අලෙවිකිරීම

මෙරට ඉතිහාසයේ අඳුරුම කාල පරිච්ඡේදවලින් එකක් නිමාවන අයුරු අපට දැන් දැකගැනීමට හැකි ය. එහෙත් එහි දී අප නිවැරදිව කටයුතු නොකළහොත් දරුණු අගාධයකට වැටීමේ අනතුර ද වෙයි. බටහිරයන් අද ක්‍රියාකරන්නේ ඒ කිසිවක් නොදැන නොවන බව ද අප දැනගත යුතු ව ඇත.

ප්‍රභාකරන්ට මෙන් ම සිංහල ප්‍රභාකරන්ට ද දේශපාලන වශයෙන් ගත්කල අපල කාලයක් උදා වී ඇත. සිංහල ප්‍රභාකරන්ගේ දේශපාලන ජීවිතය දික්කිරීමට ජනමාධ්‍ය දිගින් දිගට ම කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය. එහෙත් ඔහුට හා ඔහු සමග කටයුතු කරන ගිහි පැවිදි පිරිසට මෙරට දේශපාලනයෙහි කළහැකි බලපෑම දිගින් දිගට ම අඩුවනු ඇත. සිංහල ප්‍රභාකරන් මෙරට දේශපාලනයෙහි කරන බලපෑම වාසුදේව නානායක්කාර, වික්‍රමබාහු කරුණාරත්න මහත්වරුන් කරන බලපෑමට වඩා වෙනස් නො වේ. ජනමාධ්‍ය, විශේෂයෙන් ම රූපවාහිනී මාධ්‍යය නොවන්නට මේ මහත්වරුන්ගේ දේශපාලන ජීවිත මේ වන විට අවසන් විය යුතු ව තිබුණි.

ඉරී විසිරී ඇති ජාතික හෙළ උරුමය අණ්ඩ දමා ටික කලක් පවත්වාගෙන යෑමේ වෑයමක් ඇති බව පැහැදිලි ය. පසුගිය බදාදා උඩුවේ ධම්මාලෝක හිමියන් විසින්  පවත්වන ලද ජනමාධ්‍ය හමුවට වෙනත් හාමුදුරුවරු ද සහභාගි විමෙන් ඒ බව පැහැදිලි වෙයි. ඒ එක්තරා ආකාරයකින් ගත්කල ධම්මාලෝක හිමියන් කිරීමට තිබූ ප්‍රකාශ තාවකාලික ව කල්දමා ගැනීමක් විය. එහෙත් ජාතික හෙළ උරුමය වැනි පක්ෂ හා කණ්ඩායම් අතර වූ අශුද්ධ සංධානයක් අණ්ඩ දමා උප්පරවැට්ටි මගින් පවත්වාගෙන ගිය හැකි නො වෙයි.

සිංහල ප්‍රභාකරන් ජනමාධ්‍ය ඔස්සේ පමණක් මින් ඉදිරියට දේශපාලනයෙහි ජීවත්වන බැවින් ඔහු හා ඔහුගේ ගිහි පැවිදි අවස්ථාවාදී බල ලෝභීන් ගැන කතාකිරීම නිෂ්ඵල කාරයයකි. අද අපට සාකච්ඡා කිරීමට ඇත්තේ ප්‍රභාකරන්ගේ දේශපාලන ජීවිතය ය. ප්‍රභාකරන් යන ප්‍රපංචය පවත්වාගෙන යනු ලැබුවේ බටහිරයන් විසින් ය. මුල දී ඔහුට ඉන්දියාවෙන් ආධාර ලැබිණි. ජේ ආර් ජයවර්ධන මහතාගේ බටහිර ගැති ආණ්ඩුවට විරුද්ධව ප්‍රභාකරන් යොදාගැනීමට ඉන්දිරා ගාන්ධි මහත්මියගේ ආණ්ඩුව තීරණය කිරීමෙන් පසුව ය. එහෙත් දෙමළ ජාතිවාදය යනු ලන්දේසීන් හා පසුව බ්‍රිතානීන් විසින් ඇතිකරනු ලැබූ බ්‍රිතානින් විසින් පවත්වාගෙන යනු ලැබූ දැන් ඇමරිකාව ප්‍රමුඛ බටහිරයන් විසින් නඩත්තු කෙරෙන දේශපාලන ප්‍රවාහයක් වෙයි. ඒ ඇතිකරනු ලැබුයේත් පවත්වාගෙන යනු ලැබුයේත් නඩත්තු කෙරෙන්නේත් සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ට එරෙහිව ය. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික දේශපාලනික හා ආර්ථික යටත්විජිතවාදයෙහි එක් අවයවයක් ලෙස දෙමළ ජාතිවාදය ක්‍රියාත්මක කෙරෙන්නේ මෙරට සිංහලත්වයට හිමි තැන අහිමි කිරීමට ය.

මුල දී ඉන්දියාව විසින් ඇති දැඩි කරනු ලැබුව ද වැඩිකල් නොගොස් ම ඉන්දියාවට කොටි සංවිධානය එපා විය. සමහර විට ඉන්දියාව කොටි පිටුපස ඇති බටහිර බලවේග ගැන අවබෝධ කර ගන්නට ඇත. ඒ නැතත් අද ඉන්දියාව කොටි සංවිධානයට විරුද්ධ වෙයි. අද කොටි සංවිධානය රැකෙන්නේ බටහිරයන් නිසා ය. තමිල්සෙල්වන් නම් ත්‍රස්තවාදියා ලංකාණ්ඩුවේ ම හෙලිකොප්ටරයෙන් කටුනායකට පැමිණ බටහිර රටවලට යෑමට පෙර ඉල්ලන්නේ බටහිරයන් ලංකාණ්ඩුවට දීමට නියමිත ණය ලබා නො දෙන ලෙස ය. ණය දීමට නම් ලංකාණ්ඩුව කොටි සංවිධානයේ කොන්දේසි මත, එනම් අන්තර් ස්වයං පාලන අධිකාරයක් පදනම්කර ගනිමින්, සාකච්ඡා ආරම්භ කළ යුතු යැයි තමිල්සෙල්වන් කියයි. එය බටහිරයන් විසින් තමිල්සෙල්වන් ලවා කරවන ප්‍රකාශයක් ද විය හැකි ය.

කෙසේ වෙතත් මේ ත්‍රස්තවාදියා යුරෝපයට ගිය අවස්ථාවෙහි ඔහු ඉතා ඉහළින් පිළිගැනෙයි. ත්‍රස්තවාදය ලොවින් තුරන්කිරීම ගැන නොයෙකුත් බයිලා කියන බටහිරයන් තමිල්සෙල්වන්ට සලකන්නේ ත්‍රස්තවාදියකුට සලකන අයුරින් නො වෙයි. සෑමදාමත් තම දේශපාලන විරුද්ධවාදීන් ඝාතනය කරන කොටි නියෝජිතයන් බටහිරයන් විසින් ඉහළින් පිළිගැනෙන්නේ කෙසේ ද? ඊ පී ආර් එල් එෆ් ප්ලොට් ආදී සංවිධානවල සාමාජිකයන් මරන්නේ සදාම් හුසේන් යැයි බටහිරයන් සිතන්නේ ද? කෙසේ වෙතත් බටහිරයන්ගේ බයිලා හා වෙනත් දෙඩවිලි හරහා ද තවදුරටත් ප්‍රභාකරන් පවත්‍ාගෙන යෑම ඔවුන්ට ම ප්‍රශ්නයක් වී ඇත. එයට හේතුව කොටි සංවිධානය අද දෙකඩ තෙකඩ වීම පමණක් නො

© Prof. Nalin De Silva

වෙයි. ප්‍රභාකරන් හා දෙමළ ජාතිවාදීන්ගේ ඉල්ලීම් ලබා දීමට කෙසේවත් නොහැකිවීම එහි දී බලපාන ප්‍රධාන කරුණ වෙයි.

ප්‍රභාකරන් යනු මහා යුද්ධ දක්ෂයෙක් නො වෙයි. ඔහු හා කොටි සංවිධානය පුම්බනු ලැබුයේ බටහිර ජනමාධ්‍ය විසින් ය. විශේෂයෙන් ම බ්‍රිතාන්‍ය ජනමාධ්‍ය එහි දී විශාල කාර්යභාරයක් ඉටු කෙළේ ය. එහි මූලිකත්වය ගත්තේ බී බී සී නමින් බොරු අපක්ෂපාතීත්වයක් ගැන තමන් ම සහතිකපත් ලබාදෙමින් හා ලබාගනිමින් පවත්වාගෙන යන බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ සියුම් ආරක්ෂකයා වෙයි. එය බ්‍රිතාන්‍ය සංස්කෘතිය ලෝ පුරා පැතිරවීමට  හා පවත්වාගෙන යෑමට කටයුතු කරන ජඩමාධ්‍යය වෙයි. බී බී සි ය ගැන අපට උගන්වා ඇත්තේ සුද්දන් ම ය.  එහි අපක්ෂපාතීත්වය ගැන කියන්නෝ ද ඔවුහුම වෙති. එහෙත් එය බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ ජඩමාධ්‍ය වෙයි. අප ඒ බව දැන්වත් තේරුම් ගතයුතු ය. බීබී සිය තම අගුපිලේ පවත්වාගෙනයන සංදේශය වැනි වැඩ සටහන් ඒ ඒ රටවල ජනයාගේ බසින් ම බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය පවත්වාගෙන යෑමට ආධාර වෙයි. බටහිර ජනමාධ්‍ය හා ඔවුන් අනුකරණය කරන මෙරට පුස්සන් නිසා ප්‍රභාකරන් යුද්ධ දක්ෂයකු වූවා මිස ඔහුගේ හැකියාවකට එවැන්නකු වූවා නො වෙයි. ප්‍රභාකරන් හා කොටි සංවිධානය අනභිබවනීය යැයි මොවුහු පෙන්වා දුන්හ. කොටි ලෝකයේ හොඳම ගරිල්ලා සංවිධානය යැයි මේ පුස්සෝ අපට එත්තුගැන්වීමට උත්සාහ කළහ. එහෙත් අපි ඒ නො පිළිගත්තෙමු. බටහිරයන් විසින් පුම්බනු කැබූ  ප්‍රභාකරන් නිවටයකු බව අපි දැන සිටියෙමු.

අද ඒ බව කාහටත් පසක් වී ඇත. ඒ කරුණාගේ පිහිටෙන් ය. ප්‍රභාකරන් යනු කවුදැයි කරුණා පෙන්නුම් කර දී ඇත. බටහිරයන්ට තව දුරටත් ප්‍රභාකරන් මිථ්‍යාව පවත්වාගෙන යා හැකි නො වෙයි. අද කරුණා ද, ඩග්ලස් දේවානන්ද ද ආනන්ද සංගරී මහතා ද කොටින්ට විරුද්ධව ප්‍රසිද්ධියේ ක්‍රියා කරති. ඒ අතර කොටි සංවිධානයේ තව තවත් භේදවීම් ගැන කියැවෙයි. කොටි හා ප්‍රභාකරන් යන ගී කියන බව පැහැදිලි ය. තව අවුරුදු පහක් අල්ලාගෙන සිටියහොත් ලංකාණ්ඩුවට කොටි මුළුමනින්ම අතුගා දැමිය හැකි ය. හරිහැටි කටයුතු කරන්නේ නම් අවුරුද්දකින් කොටි නැතිකර දැමිය හැකි ය. කරුණා උතුර නැගෙනහිර එක්කිරීමේ සිහිනය බිඳ දමා ඇත.

එහෙත් ඒ නිසා ම බටහිරයෝ කොටි නැතිකිරීමට ආණ්ඩුවට උපදේශයක්වත් නො දෙති  ඔවුන් උපදෙස් දුන්න ද ඒ පිළිගත යුතු යැයි මෙයින් නො කියැවෙයි. බටහිරයන් තඹ සල්ලියකට විශ්වාස නොකළ යුතු ය.  අද බටහිරයන් තැත්කරන්නේ කොටි සංවිධානය විනාශ වීමට පෙර කෙසේ හෝ ආණ්ඩුවට බලපෑම් කර ඊනියා සාකච්ඡා මගින් ඊළම ලබා දීමට ය. එහෙත් ඉන්දියාව එයට හරහට සිටියි. ඉන්දියාවට අවශ්‍ය කරන්නේ පළාත්සභා මට්ටමේ බලය බෙදීමක් දෙමළ ජාතිවාදයට ලබා දීම ය. එහෙත් එය මෙරට ඉතිහාසයට, භූගෝලයට හා ජන ජීවිතයට විරුද්ධව යන්නකි. ඉන්දියාව වුව ද ප්‍රශ්නය දෙස බලන්නේ ඔවුන්ගේ ඇසින් මිස අපේ ඇසින් නො වෙයි.

ප්‍රශ්නයේ මුල දෙමළ ජාතිවාදය ය. සිංහලත්වයට මෙරට හිමි තැන අභිමිකරන දෙමළ ජාතිවාදය ය. දහනමවැනි සියවසේ සිට රටේම නායකත්වය දෙමළ ජනයාට දීමට බ්‍රිතාන්‍යයෝ කටයුතු කළහ. ඒ සඳහා විවිධ උපාමාරු ව්‍යවස්ථාදායක මණ්ඩලය, රාජ්‍ය මන්ත්‍රණ සභාව ආදිය ඔස්සේ ගෙනගියහ. මැනිං වැනි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයෝ ප්‍රසිද්ධියේ ම රාමනාදන් වැනි දෙමළ නායකයන් සමග එකතු වී මේ කාර්යය සඳහා මග පෑදූහ. එහෙත් සර්වජන ඡන්දයෙන් පසු දෙමළ ජාතිවාදයේ මේ සිහිනය සැබෑ නොවන බව බ්‍රිතාන්‍යයෝ ද දෙමළ ජාතිවාදීහු ද දැනගත්හ. විශේෂයෙන් ම 1947 මැතිවරණයෙන් පසුව චෙල්වනායගම් නම් දෙමළ ජාතිවාදී නායකයා ඒ බව අවබෝධ කර ගත්තේ ය. රටේම නායකත්වය වෙනුවට උතුරු හා නැගෙනහිර පළාත් ඉල්ලන්නට පටන්ගත්තේ ඉන් පසුව ය. ඒ සඳහා ඔවුහු බොරු ඉතිහාස ගෙතීමට පටන්ගත්හ. ඊනියා දෙමළ නිජභූමිය නම් පට්ටපල් බොරුව ගෙතූහ. ඊළම ලබාගැනීම සඳහා මුල් පියවර ලෙස ෆෙඩරල් ඉල්ලූහ. ෆෙඩරල් හෙවත් සන්ධීය යනු ප්‍රශ්නය ම මිස ප්‍රශ්නයට විසඳුමක් නො වෙයි. ප්‍රශ්නයම ප්‍රශ්නයට විසඳුමක් ලෙස ඉදිරිපත්කළ විට එය පිළිගන්නේ කවු ද?  අද ඇමරිකන් බසින් ම කියන්නේ නම් ෆෙඩරල් අලෙවි කිරීමට හැකියාවක් ලබාගෙන ඇත්තේ ප්‍රශ්නය විසඳුම ලෙස ඉදිරිපත් කිරීමෙන් ය. එය විසඳුම ලෙස ක්‍රියාත්මක කළහොත් සිදුවන්නේ ප්‍රශ්නය ඔඩු දිවීම පමණක් ය. කොටි සංවිධානය පරාජය අබියස සිටින බැවින් බටහිරයෝ හනිකට ඊනියා විසඳුම ක්‍රියාත්මක කිරීමට වෙර දරති. එයට ඉඩ නොදිය යුතු ය ~

© Prof. Nalin De Silva